**ශීර්ෂය - 101 - බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 101 - බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 ජූනි 09 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූනි 16 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චයසහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාල වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශයකි | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 1.6.1.1 (අ) | අමාත්‍යාංශය සතු අංක 18 – 4263 දරන වාහනයෙහි වටිනාකම (තක්සේරු කර නැත) මූල්‍ය නොවන වත්කම්වලට ඇතුළත් නොකිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් මූල්‍ය නොවන වත්කම් අඩුවෙන් පෙන්නුම් කර තිබුණි. | 1.6.1 (අ) ii |

### 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) දේපල, පිරියත හා උපකරණ**

දේපල, පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සංස්කෘතික අංශය සතු අංක CAM 5384, 254 -0003 හා YC 1104 දරන වාහන 03 (තක්සේරු කර නැත) මූල්‍ය ප්‍රකාශන තුළ වාහනවල වටිනාකමට ඇතුළත් කර නොතිබීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් මූල්‍ය නොවන වත්කම් අඩුවෙන් පෙන්නුම් කර තිබුණි. | අංක CAM-5384, 254-0003 හා YC-1104 දරන වාහන තක්සේරු කර දේපල, පිරියත හා උපකරණ යටතේ ඇතුලත් කිරීමට කටයුතු කරමි. | ආයතනය සතු සියලුම වාහනවල වටිනාකම් විධිමත් පරිදි තක්සේරු කර ගිණුම්ගත කළ යුතු බව. |
| (ii) | 2022 සැප්තැම්බර් 21 දිනැති 06/2022 දරන අයවැය චක්‍රලේඛයේ 20 සහ 21 වගන්ති ප්‍රකාරව අහෝසි වූ වැය ශීර්ෂ යටතේ වූ මූල්‍ය නොවන වත්කම් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

**(ආ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **ඇප ලේඛනය** | | |
| මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් බුද්ධශාසන අංශය විසින් පිළියෙල කර නොතිබුණු අතර සංස්කෘතික අංශය විසින් යාවත්කාලීන කර නොතිබුණි. | බුද්ධශාසන අංශයේ ඇප තැබිය යුතු තනතුරු 25 ක් හඳුනාගෙන ඔවුන් තැබිය යුතු ඇප සම්බන්ධව ලේඛනයක් සකස් කර ඇත. ඇප තැන්පත් මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **මූලධන වියදම්**<br>අමාත්‍යාංශයේ බුද්ධශාසන අංශයේ ඇස්තමේන්තු ප්‍රතිපාදනවලින් මු.රෙ 66 යටතේ මූලධන වැය විෂයන් 04 කට රු.70,315,000 ක ප්‍රතිපාදන මාරුකර තිබුණු අතර එම සමස්ත ප්‍රතිපාදනයම උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | නිවැරදි වියදම් ඇස්තමේන්තු සකස් කර ඒ අනුව ප්‍රතිපාදන සලසා ගත යුතු බව. |

### 2.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති අංක DMA/06 හා 2011.12.23 දිනැති "අභ්‍යන්තර පාලන ව්‍යුහය ඇගයීම සම්බන්ධ මාර්ගෝපදේශය " මැයෙන් වන චක්‍රලේඛය හා ඊට අදාළ වන අනෙකුත් චක්‍රලේඛ විධිවිධාන අනුව සඵලදායී අභ්‍යන්තර පාලන ක්‍රමයක් පවත්වාගෙන යනු ලබයි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අදාල සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු බව. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ප්‍රසම්පාදනයන්

මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනමා උද්‍යානය සඳහා පවිත්‍රතා සේවා ලබා ගැනීම 2022/2023 ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පිරිසිදු කිරීමේ සේවාව ලබාගැනීම සඳහා වෙළඳපොල මිල සැදහුම් ලංසු ක්‍රමය භාවිතා කර අමාත්‍යාංශයේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් ලංසු කැඳවීමට අමාත්‍යාංශයේ සුළු ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය හිමිව තිබුණද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 හා 4.3.2 ප්‍රකාරව මෙම ප්‍රසම්පාදන කාර්යය සඳහා වූ මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර අනුමැතිය ලබාගෙන නොතිබුණි. | මීට අදාළව වියදම් ඇස්තමේන්තුවක් හා පිරිවිතරයන් අදාල ආයතනයෙන් ඉල්ලීම් කල අතර, පසුගිය මාසවලට අදාළ වියදම් ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර ඇත. මෙය නිවැරදි නොවන බව පිළිගනිමි. ඉදිරියේ දී මිළ ගණන් කැඳවීමේ දී නිවැරදිව එය සකස් කිරීමට පියවර ගනිමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

### 3.2 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විද්‍යාලංකාර ජාත්‍යන්තර බෞද්ධ සම්මන්ත්‍රණ ශාලාව ඉදිකිරීම අදියර 1 සිට 5 දක්වා<br>රු.මිලියන 1350 ක මූලික ඇස්තමේන්තුවක් මත 2005 වර්ෂයේ ආරම්භ කර 2017 සැප්තැම්බර් 30 දින නිම කිරීමට නියමිතව තිබූ විද්‍යාලංකාර ජාත්‍යන්තර බෞද්ධ සම්මන්ත්‍රණ ශාලාව අදියර 05ක් දක්වා ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 1245.18 ක පිරිවැයක් දරා තිබුණි. කාර්යසාධන වාර්තාව අනුව | හඳුනාගත් අඩුපාඩු සකස් කිරීම සඳහා විශේෂඥ උපදේශන සේවා ලබාගත් අතර එම උපදෙස්, නිරීක්ෂණ හා නිර්දේශ අනුව අදාල අලුත්වැඩියා කටයුතු සිදුකරන ලෙස ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය වෙත දන්වා ඇති අතර අදාල ආයතනය විසින් දෝෂ නිවැරදි කරමින් පවතී.<br>මේ වන විට අනුකූලතා සහතිකය ලබා ගෙන ඇති | ගොඩනැගිල්ලේ ඉදිකිරීම්වල පවතින අඩුපාඩු සම්පූර්ණ කර කඩිනමින් භාවිතය සඳහා යෙදවිය යුතු බව. |

ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අවසන් බව දක්වා තිබූ අතර ඊට අදාලව 2022 නොවැම්බර් 29 දින සිදුකරන ලද ස්ථානීය පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ කරුණු පහත සඳහන් පරිදි විය.

(i) අත්තිවාරමේ පවතින දෝෂ සහිත බව නිසා ප්‍රධාන ගොඩනැගිල්ලට සමානව ඉදිරිපස හා පිටුපස පඩිපේලි ගිලා බැස ඒවායේ ටයිල් ගැලවී තිබුණු අතර ප්‍රවේශ පඩිපෙළ හා සම්බන්ධ බිත්ති පුපුරා ඉරිතැලීම් පැවතුණි. ගිලා බැස්මේ උපරිම ප්‍රමාණය මැනීම සඳහා සම්බන්ධිත පඩිපේලි මත වැලි කොට්ට අසුරා තිබුණි.

(ii)ගොඩනැගිල්ල තුළට පිටතින් ජලය කාන්දුවෙමින් පැවති අතර මධ්‍යම වායු සමීකරණ පද්ධතිය සහිත කාමරයේ ද ජලය කාන්දුවීම් පැවතුණි. ජල ටැංකි ස්ථාපනය කර තිබූ ස්ථානයේ දිය සීරාව මත විවිධ පැළැටි වැවී කිහිප තැනක දියසෙවල බැඳී තිබුණි.

(iii)ගොඩනැගිල්ලේ ඉහලම මහලෙහි ලින්ටල්වල බදාම තට්ටු ගැලවී තිබුණි.

(iv)ප්‍රධාන ශ්‍රවණාගාරයේ සවිකර තිබූ ආසන මත පුස් සැදී තිබූ අතර සවි කරන ලද තිර රෙදි අපවිත්‍ර වී තිබූ බවත් ඇතැම් තිර රෙදි අනාරක්ෂිතව අපවිත්‍ර වන සේ බිම ගොඩ ගසා තිබුණි..

(v)ගොඩනාගිල්ලේ සවි කර තිබූ ගිනි නිවීමේ උපකරණ 2019.11.10 දින කල් ඉකුත් වී තිබුණි.

(vi)ගොඩනැගිල්ල පිහිටි භූමි පරිශ්‍රය වල් බිහිවී තිබූ අතර විවිධ වැල් වර්ග ගොඩනැගිල්ල ඇතුළත දක්වා ද වැවී තිබුණි.

(vii)කෙසේ වුවද, මෙම සම්මන්ත්‍රණ ශාලා ගොඩනැගිල්ල මෙම වාර්තාවේ දින වන විටත් භාවිතයෙන් තොරව නිශ්කාර්යව පැවතුණි.

අතර හඳුනාගත් දෝෂ නිවැරදි කිරීමට යටත්ව 2023.05.09 වන දින විද්‍යාලංකාර භාරය වෙත ගොඩනැගිල්ල භාර දී ඇත

| | | | |
|---|---|---|---|
| (ආ) | 2018 ඔක්තෝබර් 10 දිනැති 03/2018 අංක දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව 2019 මාර්තු 31 දිනට පෙර රජයට අයත් වාහනවල ලියාපදිංචි අයිතිය පිළිබඳ ගැටලු නිරාකරණය කර ගත යුතු වුවද සංස්කෘතික අංශය විසින් පරිහරණය කරනු ලබන අංක KU – 1910, CAM – 5384 හා 32 – 5805 දරන වාහන 03 හි අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම වාහන ඉදිරියේදී පවරා ගැනීමට හෝ එසේ පවරා දීමට, ඊට අදාල ආයතන එකඟතාවය පළ නොකලහොත් එම ආයතන වෙත නිදහස් කිරීමට ඉදිරියේදී කටයුතු කරමි. | වාහනවල ලියාපදිංචි අයිතිය පිළිබඳ ගැටලු නිරාකරණය කර නීත්‍යානුකූල අයිතිය පවරා ගැනිමට කටයුතු කල යුතු බව. |
| (ඇ) | අපහරණය කළ යුතු ලෙස හඳුනාගෙන තිබූ සංස්කෘතික අංශය සතු අංක 301-4103, QY-1829 හා 18-7052 දරන වාහන 03 නාගරික සංවර්ධන අධිකාරියට අයත් බත්තරමුල්ල ප්‍රදේශයේ පිහිටි රථ ගාලක අනාරක්ෂිතව ගාල්කර තිබූ අතර එම වාහන සම්බන්ධයෙන් 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 (II) අනුව කටයුතු කර නොතිබුණි. | මෙම වාහන අපහරණය කිරීමට ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් පළ කලත්, අංක 301-4003 හා 18-7052 යන වාහන සඳහා ප්‍රමාණවත් ලංසු ඉදිරිපත් නොවීම හේතුවෙන් විකිණීමට නොහැකි විය. දැන්වීම් සඳහා වන පිරිවැය අඩුකර ගැනීම සඳහා අමාත්‍යාංශයේ අනෙකුත් ආයතනයන් අපහරණ දැන්වීම් පළකරන අවස්ථාවන්වල නැවත අපහරණය කිරීමට කටයුතු කරමි.<br><br>අංක QY -1829 දරන ත්‍රීරෝද රථයේ චැසි අංකය ඇති ස්ථානය දිරාපත්වීමෙන් චැසි අංකය හඳුනාගත නොහැකි වූ බැවින් ලියාපදිංචිය අවලංගුකර අබලි ද්‍රව්‍ය ලෙස අපහරණය කිරීමට නොහැකි වී ඇත. මේ සම්බන්ධයෙන් මෝටර් රථ දෙපාර්තමේන්තුවෙන් විමසා ඒ අනුව කටයුතු කරමි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |
| (ඈ) | තොරතුරු සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ පැවති තිස්සමහාරාම, රන්මිණිතැන්නේ පිහිටි මහින්ද රාජපක්ෂ ටෙලි සිනමා උද්‍යානය, 2020 අගෝස්තු 09 දිනැති අංක 2187/27 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත පවරා | චක්‍රලේඛය අනුව කටයුතු කර මෙම අමාත්‍යාංශය දැනුවත් කරන ලෙසට ජනමාධ්‍ය අමාත්‍යාංශයෙන් කරන ලද ඉල්ලීමට අනුව 08 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ඉදිරියේ දී කටයුතු කරන බව ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් දන්වා ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

තිබුණි. ඒ අනුව, ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම්ගේ අංක MMI/05/08/16 හා 2020 දෙසැම්බර් 04 දින දරන ලිපිය මගින්, වාහන 09 ක් රන්මිණිතැන්න උද්‍යානයට අනුයුක්ත කර තිබූ අතර අමාත්‍යාංශ අතර වත්කම් මාරු කිරීමේදී හා පැවරීමේදී 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ II කොටසේ 8 වගන්තියේ සඳහන් නිර්ණායක ප්‍රකාරව කටයුතු කළ යුතු වුවත් අදාල පැවරීම ඊට අනුකූලව සිදුකර නොතිබුණි.

## 3.3 රජයේ නිලධාරින් ඇප තැබීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේමුදල් රෙගුලාසි 880 ප්‍රකාරව රජයේ නිලධාරින්ගේ ඇප ආඥා පනතේ 612 වන අධිකාරිය අනුව අමාත්‍යාංශයේ බුද්ධශාසන අංශයේ ඇප තැබිය යුතු නිලධාරින් 25 දෙනෙකුගෙන් ඇප මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඇප තැබිය යුතු තනතුරු 25 හඳුනාගෙන ඔවුන් තැබිය යුතු ඇප සම්බන්ධව ලේඛනයක් සකස් කර ඇත. මේ වන විට ඇප තැන්පත් මුදල් අය කර ගැනීමට කටයුතු කරමින් පවතී. | මුදල් රෙගුලාසි 880 විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

## 3.4 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දඹදිව වන්දනා සංවිධායකයින් අමාත්‍යාංශයෙහි ලියාපදිංචිවීම තුළින් දඹදිව වන්දනා චාරිකාවේ යෙදෙන්නන්ට නිදහස් වීසා ලබා ගැනීමේ පහසුව සැලසීම, විදේශ ගමන් බලපත්‍ර ලබාගැනීමේ පහසුව හා වන්දනාකරුවන්ට වැඩි ආරක්ෂාවක් සැපයීම වැනි අවස්ථාවන් හිමිවන නමුත් ඔවුන්ට | මෙම ගැටළුවට විසඳුමක් ලෙස ඇගයීම් පත්‍රිකාවක් සකස් කර ඇති අතර සියළුම චාරිකා සංවිධායකයින් වෙත ලබාදීමට කටයුතු කෙරේ. චාරිකාව අවසන් කර සති දෙකක් තුල එම අයදුම්පත අමාත්‍යාංශය වෙත භාරදිය යුතුය. ඒ මත ඉදිරි නිර්දේශ | සංවිධායකයින් හා වන්දනාකරුවන් දැනුවත් කිරීමේ විධිමත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළයුතු වන අතර වන්දනාකරුවන්ට ලැබෙන නිදහස් වීසා |

| | | | |
|---|---|---|---|
| | ලැබෙන මෙම පහසුකම් පිළිබඳව සංවිධායකයින් සහ වන්දනාකරුවන් දැනුවත්කිරීමේ විධිමත් වැඩපිළිවෙලක් අමාත්‍යාංශය තුළ ක්‍රියාත්මක කර නොතිබුණි. තවද, නිදහස් වීසා පහසුකම් ලබාදීම තුළින් වියදම අඩුවීමේ වාසිය වන්දනාකරුවන්ට හිමිවන්නේද යන්න පිළිබඳ පසු විපරම් කිරීමටද කටයුතු කර නොතිබුණි. | කිරීම් සිදු කිරීම සහ චාරිකාවේ යෙදෙන්නන්ගේ දුරකථන අංකද ලබා ගෙන ඔවුන් වෙත ඇගයීම් පත්‍රිකාවක් නියදි ක්‍රමයකට යොමු කර තොරතුරු ලබා ගැනීමට සැලසුම් කර ඇත. | පහසුකම ඔවුන්ට ලැබෙන්නේද යන්න පිළිබඳව පසුවිපරම් කිරීමට විධිමත් වැඩපිළිවෙළක් සකස් කළ යුතු බව. |
| (ආ) | නිදහස් උත්සවයේ නර්තනාංග සඳහා ඇඳුම් වෙනුවෙන් අමාත්‍යාංශයේ සංස්කෘතික අංශය විසින් රු.4,429,800 ක් වැය කර තිබුණු අතර එම ඇඳුම් විධිමත්ව නර්තන ඇඳුම් ගබඩාවේ තැන්පත් කර නොතිබීම හේතුවෙන් රංග වස්ත්‍රාභරණවල ශේෂයන්හි නිවැරදිතාවය විගණනයේදී තහවුරු කර ගත නොහැකි වූ අතර නිශ්කාර්යව ගොඩගසා ඇති බව නිරීක්ෂණය විය. | ප්‍රවර්ධන අංශයේ සහ නර්ථන ඇඳුම් ගබඩාවේ, තැන්පත් කර තිබූ නර්ථන ඇඳුම් තොග නිසි පරිදි ගණනය කර සීආර් පොතක සටහන් කර නිවැරදිව තොග පොතට ඇතුළත් කරන ලෙස උපදෙස් දී ඇත. | නර්තනාංග නැවත භාවිතා කිරීමට හැකිවන ලෙස ගබඩා කළ යුතු බව හා වෙනත් විකල්ප අවස්ථාවන් සඳහා භාවිතා කිරීමට වැඩ පිළිවෙළක් යෙදිය යුතු බව. |
| (ඇ) | රජයේ ඉඩමක පිහිටි මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනමා උද්‍යානය ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය යටතේ පැවති කාලසීමාවේදී එම අමාත්‍යාංශයේ බලයලත් නිලධාරියා වෙත විශේෂ කොන්දේසි කීපයක් යටතේ පැවරීම සිදුකර තිබුණි. උද්‍යානය ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත පැවරී වසර 02 කට වැඩි කාලයක් ගත වී තිබුණද අදාල ඉඩම අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | එම ඉඩම ජනමාධ්‍ය අමාත්‍යාංශයේ බලයලත් නිලධාරී නමට විශේෂ කොන්දේසි කිහිපයක් යටතේ පැවරී ඇති බැවින්, ඉඩමේ ඔප්පුව නිරවුල් කර ගැනීම සඳහා අධ්‍යක්ෂ ජනරාල් විසින් රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. ආයතනය නිශ්චිතව යම් අමාත්‍යාංශයක් යටතට පත් කරන තෙක් ඉඩම පවරා ගැනීමේ කටයුතු කල්දමා තිබුණද මේ වන විට නිශ්චිතව කැබිනට් අමාත්‍යාංශයක් යටතට පැවරී ඇති බැවින් එම අමාත්‍යාංශයේ බලයලත් නිලධාරියකු වෙත ඉඩමේ අයිතිය පවරා ගැනීමට අපේක්ෂිතය. | අදාල අමාත්‍යාංශය වෙත ඉඩමේ අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු බව. |

(ඇ) ජාතික ප්‍රාසාංග කලා මධ්‍යස්ථානයේ මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් සිදු කරන ලද විගණන පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

| | | |
|---|---|---|
| (i)2020 සැප්තැම්බර් 25 දින සිට ජාතික උරුම ප්‍රාසාංගික කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පැවති නෙළුම් පොකුණ රඟහල, 2022 ජූලි 22 දිනැති අංක 2289/49 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතට පත්කර තිබුණද, රඟහල විධිමත් පරිදි සංස්ථාපනය කිරීම උක්ත අමාත්‍යාංශ විසින් 2022 දෙසැම්බර් 31 දින වන විටත් සිදු කර නොතිබුණි. | මෙම ආයතනය ව්‍යවස්ථාපිත ආයතනයක් බවට පත් කිරීම සඳහා 2023.02.22 දිනැතිව බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු ගරු අමාත්‍යතුමාගේ අත්සනින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2023.03.28 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ලැබී ඇත. එම තීරණය ප්‍රකාරව මෙම ආයතනය රාජ්‍ය - පුද්ගලික හවුල්කාරීත්ව ක්‍රමවේදය යටතේ කළමනාකරණය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඇත. | නෙළුම් පොකුණ රඟහල විධිමත් පරිදි සංස්ථාපනය කිරීමට කටයුතු කළ යුතු බව. |
| (ii)රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක SA/AMP/Deposit/Transfer දරන 2020 ජනවාරි 09 දිනැති ලිපිය ප්‍රකාරව රඟහලේ ආදායම් සඳහා ආදායම් ශීර්ෂයක් ඇතිකර ගැනීමට කටයුතු කළ යුතු වුවත් ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | රඟහල සඳහා ආදායම් හා වියදම් ශීර්ෂ අනුමත කර ගැනීමට භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර ලිපියක් යැවීමට කටයුතු කරමින් පවතී. | රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය පරිදි රඟහලේ ආදායම සඳහා ආදායම් ශීර්ෂයක් ඇති කර ගැනීමට කටයුතු කළ යුතු බව. |
| (iii)2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5.1 ඡේදය ප්‍රකාරව, සේවා සම්පාදනය සඳහා අයකරනු ලබන විවිධ ගාස්තු ඉහළ නැංවීමක් සිදු කර නොමැති සියළුම රාජ්‍ය ආයතනයන් විසින් අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය ලබාගෙන එම ගාස්තු සියයට 15 කින් හෝ ඊට වැඩි ප්‍රමාණයකින් ඉහළ නැංවීමට කටයුතු කළ යුතු වුවද, අමාත්‍යාංශය විසින් අයකරන ගාස්තු සංශෝධනය කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | 2020/ 2021 වර්ෂවල පැවති කොරෝනා තත්ත්වය හා 2022 වර්ෂයේ ඉන්ධන අර්බුදය හේතුවෙන් මෙම රඟහල වෙන්කිරීම ඉතා පහළ මට්ටමක පැවතිණි. එලෙස පැවති මට්ටම හෝ පවත්වා ගත යුතු හෙයින් මෙම ගාස්තු සංශෝධනය සිදු නොකල අතර ගාස්තු සංශෝධනය සඳහා ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2023.03.28 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ලැබී ඇත. එම තීරණය ප්‍රකාරව මෙම ආයතනය රාජ්‍ය - පුද්ගලික හවුල්කාරීත්ව | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව සේවා ගාස්තු සංශෝධනය කිරීමට කටයුතු කළ යුතු බව. |

| | | |
|---|---|---|
| | ක්‍රමවේදය යටතේ කළමනාකරණය කිරීම සඳහා 2023.04.18 දිනැතිව අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඇත. | |
| (iv)රඟහල, කුලී පදනම මත ලබා දීමේදී ඇතැම් පාර්ශවයන් වෙතින් පමණක් සහනදායී මිල ගණන් මත කුලී මුදල් අයකර (වට්ටම් ලබා දීම) තිබූ අතර එවැනි සහනදායි අයකිරීම් සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | කොළඹ විශ්වවිද්‍යාලයේ කුලපති ස්වාමීන් වහන්සේ පිළිගැනීම උදෙසා රඟහල නොමිලයේ හෝ සහනදායී මිළ යටතේ වෙන්කර ගැනීමට කර තිබූ ඉල්ලීම සැලකිල්ලට ගනිමින් 15%ක වට්ටමක් පමණක් ලබාදීමට කටයුතු කරන ලදී. ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ වාර්ෂික සහතික ප්‍රධානෝත්සවය සඳහා මුළු මුදලින් 15% ක වට්ටමක් ලබාදීම අනුමත කොට ඇත්තේ රාජ්‍ය ආයතන වෙත සහනදායී මිළ ගණන් යටතේ ලබා දීමේ පදනම මුල්කර ගනිමිනි. | කුලී මුදල් අයකිරීමේදී අනුමත මිල ගණන්වලින් බැහැරව අය කිරීම් සිදු කරන්නේ නම් ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගත යුතු බව. |
| (v)මුදල් රෙගුලාසි 3(1) අනුව රජයේ සියළුම කාර්යයන් කලින් තීරණය කර සැලසුම් හා වැඩසටහන්වල දැක්විය යුතු වුවද, රඟහලට අදාල වියදම් දැරීම සඳහා එසේ සැලසුම් කර නොතිබුණු අතර එම වියදම වාර්ෂික ඇස්තමේන්තුවේ ඇතුළත් කර පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ සඳහා වැය විෂයයක් අනුමත කර නොමැති බැවින් වාර්ෂික ඇස්තමේන්තු තුළට මෙම වියදම් ඇතුළත් කල නොහැක. ඉදිරියේ දී වැය විෂයයන් අනුමත කර ගැනීමෙන් පසු වාර්ෂික වියදම් ඇස්තමේන්තුවට ඇතුලත් කිරීම සඳහා ඉදිරිපත් කරන බව කාරුණිකව දන්වමි. | රඟහලට අදාල වියදම් දැරීමේදී වාර්ෂික වියදම් ඇස්තමේන්තු සකස් කර පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතු බව. |
| (vi) යම් මසක විදුලි බිල්පත ලැබී දින 15 ක් තුල ගෙවීම් කළ යුතු අතර ප්‍රමාද වන ගෙවීම් සඳහා 16 වන දින සිට සියයට 1.2 ක මාසික පොලී මුදලක් හිඟ බිල්පත් වටිනාකම මත අය කෙරේ. එසේ වුවද, රඟහලේ මාසික විදුලි බිල්පත් සඳහා දින 15 ක් ඇතුලත ගෙවීම් නොකිරීම හේතුවෙන් 2022 වර්ෂය සඳහා රු.460,419ක අතිරේක මුදලක් අධිභාර ලෙස ගෙවා තිබුණි. | දැනට මේ තත්ත්වය වළක්වා ගෙන නිවැරදිව කටයුතු සිදු කරනු ලැබේ. 2022 අගෝස්තු මස බිල්පත් හැර ලංවිම වෙත ගෙවිය යුතු රු.455,914 ක හිඟ මුදල ගෙවා ඇත. | ප්‍රමාදයකින් තොරව විදුලි බිල්පත් ගෙවීම් කළ යුතු බව හා ගෙවා ඇති අධිභාර සම්බන්ධයෙන් මු.රෙ 156 හා 210(2) ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

| | | |
|---|---|---|
| (vii)මධ්‍යස්ථානය තුළ පෞද්ගලික සන්නිවේදන ආයතන තුනක් මඟින් පවත්වාගෙන යන සම්ප්‍රේෂණ ඇන්ටනා සඳහා සේවා සැපයීම වෙනුවෙන් අයකරනු ලබන බදුකුලී සහ විදුලි වියදම් සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| • සම්ප්‍රේෂණ ඇන්ටනා පවත්වාගෙන යනු ලබන පෞද්ගලික සන්නිවේදන ආයතන දෙකක් සමඟ එළඹ තිබූ ගිවිසුම් 2022 දෙසැම්බර් 31 දින වන විට අවසන් වී තිබුණද, නව ගිවිසුම්වලට එළඹ නොතිබීම හේතුවෙන් මිල ගණන් සංශෝධනය කර වැඩි ආදායමක් උපයා ගැනීමට තිබූ අවස්ථාව අහිමි වී තිබුණි. | • දැනටමත් මෙම ආයතන ගෙන්වා සාකච්ඡා කර මිල ගණන් කැඳවා ඇති අතර ඉදිරි මාසයක කාලය ඇතුළත නව ගිවිසුම්වලට එළඹීමට කටයුතු කරනු ඇත. | ගිවිසුම් කාලය අවසන් වූ වහාම නව ගිවිසුම්වලට එළඹිය යුතු බව. |
| • ගිවිසුම් ප්‍රකාරව සෑම මසකම 10 වන දින බදු කුලිය ගෙවිය යුතු වුවත් උක්ත සඳහන් සන්නිවේදන ආයතන වෙතින් වාරික මුදල් නිසි පරිදි අය කර ගෙන නොතිබුණු අතර ගිවිසුම්වලට එළඹීමේදී බදු කුලිය ගෙවීම ප්‍රමාද වීම මත අයකළ යුතු දඩ මුදලක් දක්වා නොතිබීමෙන් ප්‍රමාද දඩ මුදල් අයකළ නොහැකිව තිබුණි. | එළඹෙන නව ගිවිසුමේ දී මේ තත්ත්වය නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන අතර නව ගිවිසුමට මේ සම්බන්ධයෙන් නව කොන්දේසියක් ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ. | සියලු කොන්දේසි ඇතුළත් කරමින් සන්නිවේදන ආයතන සමඟ ගිවිසුම්වලට එළඹිය යුතු බව |
| • රෝහල හා සන්නිවේදන ආයතන අතර වූ ගිවිසුම් අනුව, සම්ප්‍රේෂණ ඇන්ටනා පවත්වා ගෙන යාම සඳහා වන විදුලිය වියදම් එම ආයතන වෙතින් අය කර රෝහල විසින් පියවිය යුතු වේ. එසේ වුවද, උක්ත සඳහන් ආයතන වෙතින් 2021 හා 2022 වර්ෂ සඳහා රු.1,255,465ක මුදලක් අය කර ගෙන පියවීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු හිඟ විදුලි ගාස්තු පිළිබඳව නිවැරදි ගණනය කිරීමක් සිදුකර ගෙන යනු ලබන අතර ඒ අනුව අදාළ ආයතන වෙතින් අමාත්‍යාංශය වෙත අයවිය යුතු හිඟ විදුලි ගාස්තු අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. | සන්නිවේදන ආයතන සඳහා වන විදුලි බිල්පත් නිවැරදිව හඳුනා ගෙන අදාල ආයතන වෙතින් අය කර ගැනීමට විධිමත් පරිදි කටයුතු කළ යුතු බව. |
| (viii)ඉතා ඉහළ ආර්ථික වටිනාකමකින් යුක්ත රෝහල පරිශ්‍රයේ වර්ග අඩි 400 ක පමණ භූමියක් භාවිතා කරමින් යුධ හමුදාව විසින් ආපන ශාලාවක් පවත්වාගෙන යනු ලබන අතර | රෝහල තුළ සේවයේ නියුතු ත්‍රිවිධ හමුදා නිලධාරීන් හා සෙසු භට පිරිස් නේවාසිකව රාජකාරි සිදුකරනු ලබන බැවින් දෛනික අවශ්‍යතා සපුරා ගැනීමට මෙම ආපන ශාලාව පවත්වාගෙන යනු | අදාල ඉතා ඉහළ ආර්ථික වටිනාකමකින් යුක්ත රෝහල පරිශ්‍රයේ පවිත්‍රතා බිල්, විදුලි බිල්, ජල බිල් යනාදිය රෝහල මඟින්ම දරන |

| | | | |
|---|---|---|---|
| | එම පරිශ්‍රයට අදාල පවිත්‍රතා බිල්, විදුලි බිල්, ජල බිල් යනාදිය රඟහල විසින් දරනු ලබයි. එසේ වුවද පරිශ්‍රය භාවිතා කිරීම වෙනුවෙන් හමුදාව වෙතින් කිසිදු කුලී මුදලක් අය කර ගෙන නොතිබුණි. | ලැබේ. කෙසේ වෙතත් ගත යුතු පියවර සම්බන්ධයෙන් අමාත්‍යාංශය හා එක්ව සාකච්ඡා කරමින් පවතින බව කාරුණිකව දන්වා සිටිමි. | බැවින් තක්සේරු වටිනාකම මත කුලී මුදලක් අය කළ යුතු බව. |
| (ඉ) | කන්ද උඩරට උරුමය සුරැකීම සඳහා වූ අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩලය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ. | | |
| | (i)කන්ද උඩරට උරුමය සුරැකීම සඳහා වූ අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩලය සිදු කරනු ලබන ව්‍යාපෘති බොහෝමයක් ඉටු කිරීම සඳහා වෙනත් ආයතන පවතින බැවින් තවදුරටත් කන්ද උඩරට උරුමය සුරැකීම සඳහා වෙනමම ව්‍යාපෘතියක් පවත්වා ගෙන යාමේ අවශ්‍යතාවයක් නොමැති බව නිරීක්ෂණය විය. | මෙම ආයතනය තවදුරටත් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය සම්බන්ධයෙන් බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු ගරු අමාත්‍යතුමා හා අමාත්‍යාංශ ලේකම්තුමා සමඟ සාකච්ඡා කරමින් පවතින බැවින් ඉන්පසුව ඉදිරි කටයුතු සිදුකරන බව කාරුණිකව දන්වමි. | කන්ද උඩරට උරුමය සුරැකීම සඳහා වෙනමම ව්‍යාපෘතියක් පවත්වා ගෙන යාමේ අවශ්‍යතාවය සම්බන්ධයෙන් සලකා බැලිය යුතු බව. |
| | (ii)කන්ද උඩරට උරුමය සුරැකීම සඳහා අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩල කාර්යාල පරිශ්‍රය සඳහා මහනුවර මහනගර සභා සීමාව තුළ පිහිටි ගොඩනැගිල්ලක් බදු කුලී පදනමට ලබා ගැනීමට කටයුතු කර තිබුණි. ඊට අදාල බදු ගිවිසුමට අනුව අමාත්‍යාංශය විසින් දේපළෙහි සිදු කරන ලද රු.6,194,607ක සවිකිරීම් හා ඉදිකිරීම් සඳහා බදු ගිවිසුම අවසානයේ පවත්නා තක්සේරු වටිනාකම මත බදු දීමනාකරු වෙතින් අය කර ගැනීමට පියවර ගෙන නොතිබූ අතර නව බදු ගිවිසුමට එම කොන්දේසි ඇතුළත් කිරීමට ද කටයුතු කර නොතිබුණි. | මෙම මුදල ගොඩනැගිල්ලේ සවිකිරීම් වෙනුවෙන් බදුකරුගෙන් අයවිය යුතු මුදලකි. මෙම මුදල අයකර ගතයුතු වන්නේ එහි අදාළ සවිකිරීම් සමඟ එම ගොඩනැගිල්ල බදුකරුට භාරදුන් විටය. නමුත් එම ගොඩනැගිල්ලේ දැනට කන්ද උඩරට උරුමය සුරැකීමේ අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩලය පවත්වාගෙන යනු ලබන බැවින් එම ගොඩනැගිල්ලෙන් ඉවත් වන අවස්ථාවේදී අවසාන මාස වල බදු මුදලෙන් අයකර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | සවිකිරීම් හා ඉදිකිරීම්වල තක්සේරු වටිනාකම බදුකරු වෙතින් අය කර ගැනීම සම්බන්ධව බදු ගිවිසුමේ කොන්දේසි ඇතුළත් කළ යුතු බව. |
| (ඊ) | පූර්ණ හිමිකාරිත්වය අමාත්‍යාංශය සතු සංස්කෘතික සංරක්ෂණ හා ඉදිකිරීම් (පුද්) සමාගම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ. | | |
| | (i)සංස්කෘතික අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවල ඉදිකිරීම | මෙම සමාගම ආරම්භ කිරීම හෝ එහි විෂය පථය සම්බන්ධ | අදාල වර්ෂවල මූල්‍ය ප්‍රකාශන විගණනය |

| | | |
|---|---|---|
| හා නඩත්තු කටයුතු කාර්යක්ෂමව ඉටු කරවා ගැනීමේ අරමුණින් අමාත්‍යාංශය වෙත පූර්ණ කොටස් අයිතිය ඇතිව ලියාපදිංචි කර තිබූ සංස්කෘතික සංරක්ෂණ හා ඉදිකිරිම් (පුද්) සමාගමේ 2018/2019, 2019/2020, 2020/2021 හා 2021/2022 මූල්‍ය වර්ෂවලට අදාල මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ගොනු , අමාත්‍යාංශ විෂයපථය හා අමාත්‍යාංශය සතු ආයතන විටින් විට සංශෝධනය වීමේ දී විවිධ අංශ වෙත හුවමාරු වී තිබීම හේතුවෙන් අවශ්‍ය ලිපිගොනු සොයා ගැනීමේ අපහසුතාවයන් පවතී. | සඳහා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු බව. |
| (ii)වර්තමානයේ සමාගමේ කටයුතු සම්පූර්ණයෙන්ම අක්‍රිය වී ඇති බැවින් සමාගම ඇවර කිරීමට 2021 ජූලි 05 දින අග්‍රාමාත්‍ය ලේකම්වරයා වෙතින් ඉල්ලා තිබුණද ඇවර කිරීමේ ක්‍රියාවලිය මෙම වාර්තාවේ දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. | සමාගම ඇවර කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට නව අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීමට සකස් කර ඇත. | අක්‍රිය වී ඇති සමාගම ඇවර කිරීමට කටයුතු කළ යුතු බව. |

## 4. යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (1) සහ 40 (3) වගන්ති ප්‍රකාරව අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක විසින්, 2021 හා 2022 වර්ෂවල අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කර තිබූ විගණන විමසුම් 07 ක් සම්බන්ධයෙන් අදහස් දැක්වීම් ඉදිරිපත් කර නොතිබුණි. | මෙතෙක් පිළිතුරු නොයවන ලද අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දෙන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී. | ජාතික විගණන පනත ප්‍රකාරව විගණන විමසුම් සඳහා ප්‍රමාදයකින් තොරව අදහස් දැක්විය යුතු බව. |
| (ආ) | 2019 ජනවාරි 12 දිනැති අංක DMA/01-2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 6 වගන්තිය ප්‍රකාරව වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීමේදී මුදල් රෙගුලාසි 134(2) හි සඳහන් පරිදි විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදි විගණන සැලැස්ම සකස් කිරීමේදී අවශ්‍යතාවය අනුව විගණකාධිපතිගේ සහය ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව මුදල් රෙගුලාසි 134(2) පරිදි අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අමාත්‍යාංශයේ සංස්කෘතික අංශය සඳහා දහසකට ආසන්න කාර්ය මණ්ඩලයක් සහ දිවයින පුරා පිහිටුවා ඇති සංස්කෘතික මධ්‍යස්ථාන 208 ක් ක්‍රියාත්මකව පැවතියද, අනුමත අභ්‍යන්තර විගණක තනතුර වසර කිහිපයක සිට පුරප්පාඩුව පැවතුණි. | පුරප්පාඩුව පැවති අභ්‍යන්තර විගණක තනතුර සඳහා ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරියෙකු අනුයුක්ත කරන ලෙසට රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. මේ වන විට උක්ත පුරප්පාඩු තනතුරේ 2022.03.15 දින සිට බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරී වැඩ බැලීමේ රාජකාරි කරමින් සිටී. | ජාතික විගණන පනතේ අංක 38(ඊ) වගන්තිය ප්‍රකාර අභ්‍යන්තර විගණකවරයෙකුගෙන් සමන්විත ඒකකයක් පිහිටුවීමට කටයුතු කළ යුතු බව. |

**5. මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශයේ බුද්ධශාසන අංශය සඳහා අනුමත කාර්ය මණ්ඩලය 219 ක් හා තත්‍ය කාර්ය මණ්ඩලය 164 ක් වූ අතර 2022 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු සංඛ්‍යාව 55කි. පුරප්පාඩු සම්පූර්ණ නොකිරීම අමාත්‍යාංශයේ කාර්යසාධනය කෙරෙහි බලපෑමක් ඇති කරන බව නිරීක්ෂණය කෙරේ. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2023 මාර්තු මාසයේදී අනුමත කරන ලද බුද්ධශාසන අංශයට අදාල අනුමත කාර්ය මණ්ඩලය 219 සිට 180 දක්වා අඩු කර ඇත. 2022.12.31 දිනට පැවති අධ්‍යක්ෂ පුරප්පාඩුව මේ වන විට සම්පූර්ණ වී ඇත. | අනුමත පරිදි කාර්ය මණ්ඩලය බඳවා ගත යුතු බව. |
| (ආ) | සංස්කෘතික අංශය සඳහා සහකාර සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරීන් 201 ක් අනුමත කර තිබුණද තථ්‍ය සංඛ්‍යාව 133 ක් වූ අතර තනතුරු 68 ක් එනම් සියයට 34 ක පුරප්පාඩු පැවති අතර සංස්කෘතික අංශය සඳහා අනුමත සංවර්ධන නිලධාරි සංඛ්‍යාව 141 ක් වුවද තථ්‍ය සංඛ්‍යාව 187 ක් වුයෙන් තනතුරු 46 ක එනම්, සියයට 33 ක අතිරික්තයක් පැවතුණි. | මේ සම්බන්ධයෙන් අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතින බැවින් පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදු කල නොහැක. එසේම රාජ්‍ය ප්‍රතිපත්තියක් මත බඳවා ගන්නා ලද සංවර්ධන නිලධාරීන්, තනතුරු පසුව අනුමත කර ගැනීමේ පදනම මත සියළුම රාජ්‍ය ආයතන වෙත අනුයුක්ත කරන ලදී. මෙම නව බඳවා ගැනීම් අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය සඳහා අනුමත කර ගැනීම මේ වන විටත් සිදු කර ඇත. | අනුමත පරිදි කාර්ය මණ්ඩලය බඳවා ගත යුතු බව. |